# රුහුණ විශ්වවිද්‍යාලය

## *2023/2024 වර්ෂය සඳහා ඡායා පිටපත් සහ මුද්‍රණ කටයුතු සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදන කැඳවීම.*

රුහුණ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා ඡායා පිටපත් සේවාවන් පවත්වාගෙන යාම පිණිස ඡායා පිටපත් සේවා සපයනු ලබන සේවා සැපයුම්කරුවන් සඳහා අයදුම්පත් 2023.05.26 සිට 2023.06.14 දින දක්වා ශිෂ්‍ය කටයුතු අංශයෙන් කාර්යාල දින වලදී පෙ.ව 9.00 සිට ප.ව 3.00 අතර වේලාවන් වලදී නිකුත් කරන අතර 2023.06.20 දින ප.ව 1.00 දක්වා එම ප්‍රසම්පාදන අයදුම්පත් භාරගැනීම සිදුකරනු ලැබේ. වැඩිදුර තොරතුරු www.ruh.ac.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

*ඡායා පිටපත් සේවාවන් සැපයිය යුතු ස්ථාන පහත පරිදි වේ.*

01. ප්‍රධාන පුස්තකාලය,වැල්ලමඩම, මාතර
02. විද්‍යා පීඨය, වැල්ලමඩම, මාතර
03. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, වැල්ලමඩම, මාතර
04. කෘෂි විද්‍යා පීඨය ,මාපලාන,කඹුරුපිටිය,මාතර
05. ඉංජිනේරු පීඨය,ප්‍රධාන පුස්තකාලය,හපුගල,ගාල්ල
06. ඉංජිනේරු පීඨය, ශිෂ්‍ය මධ්‍යස්ථානය,හපුගල,ගාල්ල
07. වෛද්‍ය පීඨය,කරාපිටිය,ගාල්ල
08. තාක්ෂණ පීඨය, කරගොඩ, උයන්ගොඩ

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර සහ විස්තර ලබා ගැනීම සඳහා ආපසු ගෙවනු නොලබන රු.250/- ක ගාස්තුවක් රුහුණ විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත් ශිෂ්‍ය කටයුතු අංශයේ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන පත්‍රිකා මුද්‍රා තබා නියමිත දිනට පෙර **සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව , රුහුණ විශ්වවිද්‍යාලය, මාතර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ගෙනවිත් භාරදෙන්නේ නම් ලේඛකාධිකාරී කාර්යාලයේ ඇති අංක 01 දරණ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. අදාළ ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවර **ඡායා පිටපත් සහ මුද්‍රණ කටයුතු සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදන** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2023.06.20 දින ප.ව 1.00 දක්වා ප්‍රසම්පාදන පත් භාරගනු ලබන අතර , එදිනම එම වේලාව අවසන් වූ වහාම ප්‍රසම්පාදන පත්‍රිකා විවෘත කරනු ලැබේ.නියමිත වේලාවෙන් පසුව ලැබෙන ප්‍රසම්පාදන පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලබන අතර , මිළ ගණන් විවෘත කරනු ලබන අවස්ථාව සඳහා සැපයුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැක.

**සභාපති,විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව**
රුහුණ විශ්වවිද්‍යාලය